සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved



# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ/පෙළ) විභාගය

## නාට්‍ය හා රංගකලාව (2) - I

**13 ශ්‍රේණිය** **කාලය පැය 01 යි.**

උපදෙස් :- • ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.
• එක් එක් ප්‍රශ්නයට දී ඇති පිළිතුරු අතරින් නිවැරදි පිළිතුර තෝරා ඊට අයත් අංකය වරහන් තුළ දක්වන්න.

---

- **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**
- **පහත දැක්වෙන සංවාද / කවි / ආශ්‍රයෙන් අංක 01 සිට අංක 10 දක්වා පිළිතුරු සපයන්න.**

A අසාලා කීවේ වගතුග සියල්ලක්
යොදාලා කීවේ බොරුබස් ඇසිල්ලක්
රවාලා කීවේ අපහට දෝසයක්
කපාලා දෙමිය ගම මහගෙ බරට ගාතයක්

B අඳුන් ගාන්නී නෙත් දෙක ඔමරි කරන්නී
මල් ගවසන්නී කොන්ඩය ගොතා හෙලන්නී

C බෝ වික්‍රම ඇති පවර දොළසත් දෙවියන්ට
මේ දැක් වූ දොළොස් පාලිය අගට
සේසත් පිරිවරා එතෙර දෙවි නමට
මීමෙත් සොයා බැඳලා දෙවි පඬුරකට

D අත්වැල් ගායන කණ්ඩායම
ඔහු ගියේ හරිම සිත් වේදනාවකින් තරුණයෙකු කෝප උනොත් මොන මොනවා කරගනීවි ද?
ගියාවේ.... ගියාවේ.......

E **දීඝ** : එහෙනම් ඔබ රජ වාසලට ගියා.
**සුභ** : ගියා විතරක් නෙවෙයි මම මහ වාසල ආරක්ෂා බලමුළුවේ සේනාපති....

F **එමිලියා** : මගෙ වරුණෙ ඔයා ලියන්න ඕන කරන්නේ නෑ...
**ඉයාගො** : අපොයි නෑ..

01. මීබන්ධනය නම් නාට්‍යමය අවස්ථාව අඩංගු වන්නේ,
(1) ගම්මඩු ශාන්ති කර්මයේ ය. (2) සුනියම් කැපීමේ ය.
(3) දහ අට සන්නියේ ය. (4) සන්නියකුන් යාගයේ ය.
(5) කඩවර කංකාරියේ ය. (......)

02. උඩරට ප්‍රදේශයට ආවේණික ශාන්ති කර්මයකි.
(1) A (2) B (3) C (4) D (5) E (......)

03. ගම්මඩු ශාන්ති කර්මයට අයත් කවි / සංවාද අයත් අක්ෂරය වන්නේ,
(1) A (2) B (3) C (4) D (5) F (......)

04. "D" සංවාද කාන්ඩය අයත් නාට්‍ය රචකයා වන්නේ,
(1) විලියම් ශේක්ෂ්පියර් (2) සොෆොක්ලීස් (3) බර්නාඩ් ෂෝ
(4) ඇන්ටන් චෙනොෆ් (5) ඊඩිපස් රජ (......)

05. සොෆොක්ලීස්ගේ නාට්‍ය නිර්මාණ අතරට,

(1) හැම්ලට්  (2) ඔතෙලෝ  (3) වැනීසියේ වෙළෙන්දා

(4) රෙක්ස්  (5) වෙරි වත්ත  (......)

06. උඩරට පළාතට අයත් ජන නාට්‍යයක් දැක්වෙන අක්ෂරය වන්නේ,

(1) A  (2) B  (3) C  (4) D  (5) E  (......)

07. සයිමන් නවගත්තේගම නාට්‍ය නිර්මාණයට අයත් සංවාද කන්ඩය අයත් අක්ෂරය වන්නේ,

(1) B  (2) C  (3) E  (4) F  (5) B  (......)

08. සයිමන් නවගත්තේගම නාට්‍ය නිර්මාණයකි,

(1) පණ්ඩුකාභය  (2) ජනේලය  (3) දුන්න දුනු ගමුවේ

(4) රන් මකුණා  (5) අබිරහස් මන්දිරය
(......)

09. ඔතෙලෝ නාට්‍ය නිර්මාණයට අයත් සංවාද කාණ්ඩය,

(1) A  (2) E  (3) F  (4) B  (5) C  (......)

10. ඉහත නාට්‍ය නිර්මාණයේ නිර්මාණ කරුවා වන්නේ,

(1) විලියම් ශේක්ෂ්පියර්  (2) සොෆොක්ලීස්  (3) ජිම් නෝබට්

(4) යුරිපිඩීස්  (5) ඇරිස්ටෝටල්  (......)

11. ක්‍රි.පූ. 5 වන සියවසේ දී ග්‍රීක වේදාන්ත නාට්‍යය එහි උපරිම තලයට ගෙන ඒමට දායක වූ නාට්‍යකරුවෙකි.

(1) ඇරිස්ටෝටල්  (2) මහාකවි විලියම් ශේක්ෂ්පියර්

(3) ඉයුජින් අයනෙස්කෝ  (4) ස්ටැනිස්ලාවිස්කි  (5) ඊකිලස්  (......)

12. සොෆොක්ලීස් ජීවත් වූ කාලවකවානුව සේ සැලකේන්නේ,

(1) ක්‍රි. පූ. 525 426  (2) ක්‍රි. පූ. 496 406

(3) ක්‍රි. පූ. 480 406  (4) ක්‍රි. පූ. 406 426  (5) ක්‍රි. පූ. 496 410
(......)

13. උදයන රජු මුල්කරගත් කතා පුවත් ඇතුළත් සංස්කෘතික නාට්‍ය අතුරෙන් ''**හස්තිකාන්ත මන්තරය**'' නාට්‍ය රචනයට ඇසුරු කරනු ලබන්නේ,

(1) ප්‍රතිඥා යෞගන්ධාරායණය යි.  (2) රත්නාවලිය යි.

(3) ස්වප්නවාස්ව දන්තාය යි.  (4) ප්‍රිය දර්ශිනාව යි.  (5) මාලවිගි මිත්‍රයා යි.
(......)

14. මාරි අම්මාන් දේවිය හා ඇයගේ පුත්‍රයා පිළිබඳ අභිචාරාත්මක රාගයක් වන්නේ,

(1) වසන්තන් කුන්තු  (2) කාන්තවරායන් කුන්තු  (3) මකීඩ්

(4) තෙන්මෝඩි කුන්තු  (5) විලාසම්  (......)

15. යථාර්ථවාදී රංග රීතියෙන් බැහැර රංග ශෛලියක් අනුගමනය කරන්නා වූ අසම්මත හෙවත් විකාර රූපී නාට්‍යයන් හි මූලික ලක්ෂණයකි.

(1) චරිතවලට විශාල වැදගත්කමක් ලබාදීම.

(2) ක්‍රමානුකූලව රංගනය ගොඩනැගීම අවසානයේ සියල්ල හෙලිපෙහෙළි නොකිරීම.

(3) සිද්ධි රංගනය ප්‍රමුඛවීම

(4) කතාවින්‍යාසය මනාව ගොඩනංවා තිබීම

(5) හේතුඵල සම්බන්ධතාවය  (......)

16. නාට්‍ය රචනය හා අධ්‍යක්ෂණය සඳහා වෙනම ප්‍රවීණයන් දෙදෙනකු සිටින නාට්‍ය සම්ප්‍රදාය වන්නේ,

(1) සංස්කෘත නාට්‍ය  (2) ග්‍රීක නාට්‍ය  (3) නෝ නාට්‍ය

(4) එළිසබෙතීන නාට්‍ය (5) මධ්‍යකාලීන යුරෝපීය නාට්‍ය (......)

17. ස්වභාවිකවාදී නාට්‍යය රීතියේ පුරෝගාමියා,
(1) ඇලැක්සැන්ඩර් ඩූමා (2) හෙන්රික් ඉබ්සන්
(3) බර්ටෝල්ට් බ්‍රෙෂ්ට් (4) එමිල් සෝලා (5) ඇන්ටන් චෙකොෆ් (......)

18. සංස්කෘත නාට්‍ය ශෛලියේ භාවිතා වන පාද චලන ගණන,
(1) 32 (2) 26 (3) 44 (4) 18 (5) 9 (......)

19. 'මුවින් ගීත ගයන්නීය, හස්තයෙන් අර්ථ ප්‍රකට කරන්නීය, දෑසින් භාව දක්වන්නීය, දෙපයින් තාල තබන්නීය. ''
ඉහත පාඨය අයත් ග්‍රන්ථය වන්නේ,
(1) අභිනය දර්පණය (2) අර්ථ ශාස්ත්‍රය (3) කාව්‍ය ශාස්ත්‍රය
(4) නාට්‍ය ශාස්ත්‍රය (5) දසරූපය (......)

20. විනර්වා නාට්‍ය ව්‍යාපාරයේ පුරෝගාමියා වූයේ,
(1) සී. දොන් බස්තියන් (2) බී. ඒ. ඩබ්. ජයමාන්න
(3) සිරිසේන විමලවීර (4) චාල්ස් ඩයස් (5) පිලිප්පු සිංඤෝ (......)

21. චංගර දෙවියන් පුද ලබන නාට්‍යමය පෙළපාලියක් වන්නේ,
(1) අඹ විදමන (2) ආවැන්දුම (3) මී බන්ධනය
(4) දොළහ පෙළපාලිය (5) ඌරා යක්කම (......)

22. මහා කෝල සන්නියක්ෂයා සම්බන්ධ වන යාතු කර්මය වන්නේ,
(1) සූනියම් යාගය (2) ඇත් බන්ධනය (3) රිද්දි යාගය
(4) සන්නියකුන් යාගය (5) කඩවත් තරණය (......)

23. භූතයින්, අවතාර, අනාවැකි හා දෛවෝපගත සිදුවීම් දක්නට නොලැබෙන ශේක්ෂ්පියර් නාට්‍යයකි.
(1) මැක්බත් (2) ඔතෙලෝ (3) හැම්ලට්
(4) ජූලියස් සීසර් (5) රෝමියෝ ජුලියට් (......)

24. 'මූදු පුත්තු' නාට්‍ය නිර්මාණය සඳහා පාදක වූයේ,
(1) කොකේසියානු චෝක්සර්කල් (2) ද මැරේජ් (3) රන් ෆෝ යුවර් වයින්
(4) ද ප්‍රොපෝසල් (5) ගාර්ෂියා ලෝර්කාගේ යෙර්මා (......)

25. නිකලොයි ගොගොල් ගේ නාට්‍ය නිර්මාණයකි.
(1) කපුවා කපෝති (2) වෙස් මුහුණු (3) මූදු පුත්තු
(4) හුණු වටය (5) රෝමය ගිනි ගනී (......)

26. 1945 ලංකාවේ බිහි වූ සාර්ථක අනුවාද නාට්‍යයකි,
(1) කපුවා කපෝති (2) බෝනික්කි ගෙදර (3) හුණු වටය
(4) මනමේ (5) සිංහබාහු (......)

27. උත්තර භාරතීය රංගධාරී සංගීතය යොදාගත් නාට්‍ය සම්ප්‍රදාය,
(1) නාඩගම් (2) නූර්ති (3) කුත්තු (4) කෝලම් (5) නව නාට්‍ය
(......)

28. ''ඩිමර්'' යන්ත්‍රය මගින්,
(1) සුදු පැහැති ආලෝකය මැවිය හැකිය.
(2) වර්ණ ලෝකය සඳහා භාවිතා කරයි
(3) ගගනිකාව ආලෝකමත් කරයි.

The National e-learning Portal for The General Education

(4) සියලුම විදුලි පරිපථ යොමු කෙරෙන යන්ත්‍රයයි.
(5) වේදිකාවේ දකුණු පස එල්ලා ඇති යන්ත්‍රය යි. (......)

29. ලංකාවේ රංගභූමි ආලෝක කරණයේ පුරෝගාමී නිර්මාණකරුවා ලෙස,
(1) මහින්ද ඩයස් (2) ක්‍රිෂාන් ඩයස් (3) ශ්‍රියන්ත මෙන්ඩිස්
(4) ජනක ප්‍රේමලාල් (5) එදිරිවීර සරච්චන්ද්‍ර (......)

30. සොයන්නහු ද කවුරුන් මේ සොහොනෙහි කිතු තුමන්.....
මේ සංවාදය අයත් නාට්‍ය ප්‍රභේදය කුමක් ද?
(1) පාස්කු නාට්‍යය (2) මිස්ටරි නාට්‍ය (3) මිරැකල් නාට්‍ය
(4) මොරැලිටි නාට්‍ය (5) අනාගාමික නාට්‍ය (......)

31. '' අර්ථෝපක්ෂේප'' ක්‍රම අයත් වනුයේ,
(1) අර්ථ ප්‍රකෘති වලට ය. (2) අවස්ථා වලට ය.
(3) සූච්‍ය කොටස් වලට ය. (4) ප්‍රයෝජ්‍ය කොටස් වලට ය.
(5) ආධිනාරික කොටසට ය. (......)

32. ග්‍රීක නාට්‍ය කලාවේ සශ්‍රිකත්වයට අධිපති දෙවියෝ වන්නේ,
(1) තෙස්පිස් (2) දියෝනීසස් (3) ඇපලෝ (4) ඇනීතා (5) ඔලිම්පියන් (......)

33. අභිඥානශාකුන්තලයට පදනම් වූ කථා වස්තුව හමු වන්නේ,
(1) කථාසරිත් සාගරය (2) රාමායණය (3) මහාභාරතය
(4) පද්ම පුරාණය (5) කාලිදාස ස්වතන්ත්‍ර රචනයෙනි (......)

34. ට්‍රැජඩි සහ කොමඩි නාට්‍ය ප්‍රභේද ද්විත්වය ම නිෂ්පාදනය කළ නාට්‍ය සම්ප්‍රදායන් වන්නේ,
(1) ග්‍රීක, සංස්කෘත, රෝම (2) ග්‍රීක, රෝම, කබුකි
(3) ග්‍රීක, සංස්කෘත, එලිසබෙතීන (4) ග්‍රීක, සංස්කෘත, හෝ රෝම
(5) අත්භූත, ප්‍රාතිහාර්ය, එළිසබෙතීන (......)

35. මහාකවි භාසගේ නාට්‍ය නිර්මාණයකි,
(1) චාරු දත්ත ය. (2) ස්වප්නවාසව දත්තා ය.
(3) වෘජකටිනය (4) ප්‍රතිඥා යෞගන්ධරායණය.
(5) නල දමයන්ති (......)

36. එළිසබෙතීන යුගයට අයත් නාට්‍ය නිර්මාණය,
(1) ඔතෙලෝ (2) ලියර් රජ (3) රොබින්සන් කෘසෝ
(4) ඇන්තනී හා ක්ලියෝපැත්‍රා (5) ටෙම්පස්ට් (......)

37. ග්‍රීක නාට්‍යයේ ''චොරීගොස්'' යනු,
(1) නාට්‍ය සඳහා මුදල් යොදවන්නා (2) නාට්‍ය රචකයා
(3) අධ්‍යක්ෂකවරයා (4) නාට්‍ය නිෂ්පාදකවරයා
(5) ප්‍රධාන නළුවා (......)

38. ආරම්භයේ සිට ම ස්ත්‍රී චරිත ස්ත්‍රීන් විසින් රඟපාන ලද නාට්‍ය විශේෂය වන්නේ,
(1) කබුකි (2) නෝ (3) සංස්කෘත (4) එලිසබෙතීන (5) රෝම
(......)

39. ''කුක්ලොප්ස්'' යනු,
(1) ග්‍රීක ට්‍රැජඩියකි (2) ග්‍රීක කොමඩියකි
(3) රෝම ප්‍රහසනයකි (4) සටුර නාට්‍යයකි (5) රෝම ට්‍රැජඩියකි. (......)

40. ඇරිස්ටෝටල් න්‍යායේ වැදගත් ම ලක්ෂණයකි.
(1) චින්තනය (2) වස්තුව (3) වාග් විලාසය (4) චරිතය (5) ප්‍රේක්ෂාව

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved



# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ/පෙළ) විභාගය

## නාට්‍ය හා රංගකලාව (2) - II

13 ශ්‍රේණිය

කාලය පැය 02 යි.

සැලකිය යුතුයි :-

- **A** කොටසින් ප්‍රශ්න 02 ක් ද, **B** කොටසින් ප්‍රශ්න 02 ක් ද තෝරාගෙන ප්‍රශ්න 04 කට පිළිතුරු සපයන්න.

---

### A කොටස

(01) (i) ප්‍රාසාංගික කලා යන්නෙහි අදහස පහදන්න. (ල.04)

(ii) ප්‍රාසාංගික කලාවෙහි දක්නට ලැබෙන විශේෂ ලක්ෂණ පැහැදිලි කරන්න. (ල.05)

(iii) නාට්‍ය කලාව සෙසු ප්‍රාසාංගික කලාවන්ගෙන් වෙනස් වන අයුරු සාකච්ඡා කරන්න. (ල.06)

(02) (i) නාට්‍ය ධර්මී හා ලෝක ධර්මී යන්නෙහි අර්ථය පහදන්න. (ල.04)

(ii) ඕනෑම නාට්‍යයක අඩුවැඩි වශයෙන් මෙකී ලක්ෂණ අඩංගුය. ශෛලීන් දෙකෙන් නාට්‍ය 2 බැගින් උදාහරණ ගෙන විස්තර කරන්න. (ල.06)

(iii) ඔබ නැරඹූ නාට්‍යයක් ඇසුරෙන් නාට්‍යධර්මී රංගශෛලිය විස්තර කරන්න. (ල.05)

(03) (i) ත්‍රිවිධ ඒකීයත්වය යනුවෙන් හඳුන්වන්නේ කුමක් ද? (ල.04)

(ii) ග්‍රීක නාට්‍යයේ ත්‍රිවිධ ඒකීයත්ව රැකී ඇති අවස්ථා නිදසුන් මගින් පහදන්න. (ල.05)

(iii) ග්‍රීක නාට්‍යය කලාවේ ත්‍රිවිධ ඒකීයත්වය බිඳී ඇති අවස්ථා නිදසුන් මගින් පහදන්න. (ල.06)

### B කොටස

(04) (i) ග්‍රික නාට්‍ය හා සංස්කෘත නාට්‍ය වේදිකාව ඇඳ කොටස් නම් කරන්න. (ල.04)

(ii) එකී ස්ථානයන් හි යොදාගනු ලැබූ රංගෝපක්‍රම කවරේ ද? (ල.05)

(iii) නාට්‍යයේ ශෛලීයට අනුව රංගස්ථානය හැඩ ගැසුණු ආකාරය පහදන්න. (ල.06)

(05) (i) ඔතෙලෝ නාට්‍යය වනාහි ඛේදාන්තයක ලක්ෂණ මනාව ගොනු කොට දක්වයි. විචාරාත්මකව විමසන්න. (ල.08)

(ii) එම නාට්‍යයෙන් වත්මන් සමාජ වාතාවරණය විවර කරන්නේ යැයි ඔබ සිතන්නේ ද? එසේ නම් හේතු දක්වන්න. (ල.07)

(06) (i) උඩරට, පහතරට, සබරගමු සම්ප්‍රදායන්ට අයත් ශාන්ති කර්මය බැගින් නම් කරන්න. (ල.04)

(ii) ඉන් එක් ශාන්ති කර්මයක නාට්‍යමය ලක්ෂණ විස්තර කරන්න. (ල.05)

(iii) බෞද්ධ පූජා කර්ම වනාහි නාට්‍යමය ලක්ෂණ වලින් අනූනය. එක් නාට්‍යමය අවස්ථාවක් පිළිබඳව විස්තර කරන්න. (ල.06)